# ථෙරවාද අභිධර්මයේ ආචාරවිද්‍යාත්මක අගය පිළිබඳ විමර්ශනයක්

සුමනපාල ගල්මන්ගොඩ

ථෙරවාදී අභිධර්මය නමින් ගැනෙන විෂය ක්ෂේත්‍රය පිළිබඳව සාම්ප්‍රදායික නයින් මෙන්ම විචාරාත්මක දෘෂ්ටිකෝණයෙන් ද අතිවිශාල ග්‍රන්ථ සංඛ්‍යාවක් ලියවී ඇත. මේ අතුරින් පෙරපර දෙදිග විවිධ භාෂා මාධ්‍යයන්ගෙන් ලියැවී ඇති ද්විතීයික ග්‍රන්ථ හා ශාස්ත්‍රීය ලිපිලේඛන මඟින් බොහෝ විට මෙම විෂය ඇගයීමට ලක්කොට ඇත්තේ එය දාර්ශනික විෂයයක් පිළිබඳව කර ඇති ගැඹුරු ශාස්ත්‍රීය විවරණයක්ය යන උපකල්පනය මත බව පෙනේ. නිර්වාණාවබෝධය යන ආවසානික පරමාර්ථය සම්බන්ධයෙන් අභිධර්මයේ උපයෝගීත්වය පිළිගෙන ඇතත් එහි විෂය කරුණු විග්‍රහ වී ඇති ආකාරය ශුද්ධ බුද්ධිමය ශාස්ත්‍රීය පදනමකින් යුක්ත බව එම කෘතිවල බොහෝ විට අවධාරණය කොට ඇත.[1] ඇතැම් විට බටහිර දාර්ශනිකයන්ගේ මතවාදයන් සමග ද තුලනය කරමින් එහි ශාස්ත්‍රීයත්වය මතුකර පෙන්වීමට උත්සාහ දරා ඇත.[2] ථෙරවාද අභිධර්ම සම්ප්‍රදාය සතු පෞරාණික ග්‍රන්ථ සියල්ලක්ම පාහේ රචනා කොට ඇත්තේ බෞද්ධ භික්ෂූන් වහන්සේලා විසිනි. උන්වහන්සේලා සිය සම්ප්‍රදායාගත සීල, සමාධි, ප්‍රඥා සංඛ්‍යාත ධර්මමාර්ගයෙහි යෙදෙමින් ඊට උපස්ථම්භක වන පරිදි ධර්මග්‍රන්ථ රචනයෙහි උත්සුක වූ බව එම ග්‍රන්ථවල සඳහන් කොට ඇත. බටහිර දාර්ශනිකයන්ගේ චරිතකථා හා මෙම ආභිධර්මික භික්ෂූන්ගේ චරිතකථා අතර ඇත්තේ අහසට පොළව බඳු වෙනසකි. එබැවින් කෙබඳු වූ හෝ පුද්ගලයකුගේ දාර්ශනික අදහසක් සමාන වූ පමණින් අදාළ සන්දර්භය අමතක කොට දමා එය ද මෙසේ යැයි ඇගයීමට ලක් කිරීම කිසිසේත් උචිත නොවේ. ථෙරවාද අභිධර්මය පෝෂණය වූ මෙම ආගමික සන්දර්භය අමතක කොට විෂය මූලිකව බටහිර න්‍යායානුගතව ශාස්ත්‍රීය විවරණ ඉදිරිපත් කිරීමට යුහුසුලු වීම නිසා අභිධර්මය පුරා විහිදී පවතින ආචාරාත්මක පසුබිම නූතන විචාරාක්ෂියෙන් බොහෝ දුරට බැහැර වී ඇති සෙයක් පෙනේ. තව ද අප විසින් බොහෝ කලකට පෙර දායාද කරගන්නා ලද බටහිර ශාස්ත්‍රීය සම්ප්‍රදායය මේ වන විට බටහිර ජාතිකයන් විසින් බැහැර කරනු